# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2024 මැයි මස 17 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2024. 05. 20 දින නිකුත් කරන ලදී)**


# ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 | තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනයේ ස්ථාපිත සාමාජිකත්ව කාණ්ඩ හා අනුබද්ධ නාම වෙනස් කිරීම, වෙනත් දෑ අතර අවශ්‍යව ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය ඉහත අවශ්‍යතා සහ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපාදන සැපයීම පිණිස ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතට අවශ්‍ය සංශෝධන කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ එසේ පැනවීම යෝග්‍ය හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2024 අංක  දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(i) එම වගන්තියේ (2), (3) සහ (4) වන උපවගන්ති පිළිවෙලින් (3), (4) සහ (5) වන උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන් සහ එම වගන්තියේ (2) වන උපවගන්තිය ලෙස සංස්ථාවේ ගෞරවණීය යාවජීව සහාධ්‍යායයකු ලෙස ලියාපදිංචි වී ඇති සෑම සාමාජිකයකුටම ඔහුගේ හෝ ඇයගේ නමට පසුව "Hony. LFIQS. SL" යන සංක්ෂිප්ත නිල නාමය භාවිතා කිරීමට හිමිකම් ලැබිය යුතු ය, යන වචන ඇතුළත් කිරීමෙන්;

(ii) එම වගන්තියේ නැවත අංක යොදන ලද (3) වන උපවගන්තියේ "F.L.Q.S. SL" යන අකුරු ඉවත් කර "FIQS. SL" යන අකුරු ඇතුළත් කිරීමෙන් ;

(iii) එම උපවගන්තියේ නැවත අංක යොදන ලද (4) වන උපවගන්තිය ඉවත් කර එහි (4) වන උපවගන්තිය ලෙස සංස්ථාවේ සාමාජිකයකු ලෙස ලියාපදිංචි සෑම

සාමාජිකයකුටම ඔහුගේ හෝ ඇයගේ නමට පසුව "MIQS. SL" යන සංක්ෂිප්ත නිල නාමය භාවිතා කිරීමට හිමිකම් ලැබිය යුතුය, යන වචන ඇතුළත් කිරීමෙන්;

(iv) එම වගන්තියේ නැවත අංක යොදන ලද (5) වන උපවගන්තිය ඉවත් කර එහි (5) වන උපවගන්තිය ලෙස ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ව්‍යාපාර ආයතනයක හෝ සමාගමක මෙම පනතේ 7 වන වගන්තිය යටතේ කරනු ලැබිය හැකි නියමයන් මගින් නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් දරන හවුල්කරුවන් හෝ අධ්‍යක්ෂවරු සහ කොටස් හිමියන්ගෙන් බහුතරයක් සංස්ථාවේ සාමාජිකයන් වන විටෙක එවැනි ව්‍යාපාර ආයතනයකට හෝ සමාගමකට "වරලත් ප්‍රමාණ සමීක්ෂක" හෝ අවශ්‍ය පරිදි "වරලත් ප්‍රමාණ සමීක්ෂකයන්" යන නාමය භාවිත කිරීමට ඒ සඳහා එවැනි ව්‍යාපාර ආයතනයක හෝ සාමාගමක් විසින් පාලක සභාව වෙත කරනු ලබන ඉල්ලීමක් මත අවසර දෙනු ලැබිය හැකිය යන වචන ඇතුළත් කිරීමෙන්; සහ

(v) නැවත අංක යොදන ලද (5) වන උපවගන්තියට ඉක්බිතිවම පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ (6) වන උපවගන්තිය ලෙස පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(6) මෙම පනතේ විධිවිධානවලට යටත්ව, කිසිදු පුද්ගලයකු එම පුද්ගලයා හෝ අස්තිත්ව මෙම පනත යටතේ "වරලත් ප්‍රමාණ සමීක්ෂක" හෝ අවශ්‍ය පරිදි "වරලත් ප්‍රමාණ සමීක්ෂකයන්" ලෙස ලියාපදිංචි කරනු ලැබ ඇත්නම් මිස ඒක වචනයෙන් හෝ බහු වචනයෙන් වූ කිසිදු ආකාරයකින් හෝ භාවයකින් "වරලත් ප්‍රමාණ සමීක්ෂක" හෝ අවශ්‍ය පරිදි "වරලත් ප්‍රමාණ සමීක්ෂකයන්" යන වචන හෝ වචන කාණ්ඩ කවරක් හෝ ඇතුළත් වන යම් නමක්, නාමයක් හෝ විලාසමයක භාවිතයේ යෙදවීම, සේවයේ යෙදීම හෝ ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීම නොකළ යුත්තේ ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.